# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2345/46 - 2023 අගෝස්තු මස 16 වැනි බදාදා - 2023.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ජාතික පොලිස් කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ඊ ඊ වන ව්‍යවස්ථාව යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ඊ ඊ ඊ වන ව්‍යවස්ථාව අනුව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති.

ඊ. ඩබ්ලිව්. එම්. ලලිත් ඒකනායක,
සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව.

2023 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ 07,
බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය,
09 වන ගොඩනැගිල්ල,
ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

**මහජන පැමිණිලි විමර්ශනය කිරීම සඳහා වන කාර්ය පාටිපාටික රීති**

1. මෙම රීති "**2023 කාර්ය පටිපාටික රීති (පොලිස් නිලධාරීන් හෝ පොලිස් සේවයට එරෙහිව මහජන පැමිණිලි විමර්ශන)**" යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. පොලිස් නිලධාරියෙකුගේ හෝ පොදුවේ පොලිස් සේවයේ ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් අගතියට පත් ඕනෑම පුද්ගලයකු හෝ එසේ අගතියට පත් පුද්ගලයකු විසින් බලය පවරන ලද තැනැත්තෙකු (මෙහි මින් මතු "පැමිණිලිකරු" ලෙස හඳුන්වන ලබන) විසින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ (මෙහි මින් මතු "කොමිෂන් සභාව" ලෙස හඳුන්වනු ලබන) මහජන පැමිණිලි විමර්ශන අංශය වෙත හෝ ඕනෑම පළාත් කාර්යාලයකට, අදාළ වන නීති/ රෙගුලාසිවලට අනුකූලව සුදුසු පිළියමක් පතා පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකිය.

1A - PG 6449 — 106 (2023/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පැමිණිලිකරු පැමිණිල්ලක් ඉදිරිපත් කරන විට, එම පැමිණිල්ලේ පහත සඳහන් තොරතුරු ද සඳහන් කළ යුතුය.

i. පැමිණිලිකරුගේ නම හා ලිපිනය ;
ii. පැමිණිලිකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය ;
iii. පැමිණිලිකරුගේ දුරකථන අංකය (ඇත්නම්) ;
iv. පැමිණිල්ල කර ඇත්තේ කුමන පොලිස් ස්ථානයකට එරෙහිවද ;
v. පැමිණිල්ලට ලක් වී ඇති පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් වූ අනන්‍යතාව හා විස්තර ;
vi. සිද්ධිය හෝ පැමිණිල්ල සිදුවූ ස්ථානයට අදාල දිස්ත්‍රික්කය ;

3. ඉහත 2 වන රීතියෙන් අපේක්ෂා කරන පරිදි, කොමිෂන් සභාව/ මහජන පැමිණිලි විමර්ශන අංශය වෙත කරන ලද මහජන පැමිණිලි විමර්ශනය කිරීම කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ උපදෙස් මත මහජන පැමිණිලි විමර්ශන අංශයේ අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, පළාත් අධ්‍යක්ෂ හෝ විමර්ශන නිලධාරි ලෙස කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සහ නම් කරන ලද (මෙහි මින් මතු "බලයලත් නිලධාරියා" ලෙස හඳුන්වනු ලබන) නිලධාරියෙකු විසින් සිදුකරනු ලැබේ.

4. රටේ සෑම පළාතකම පිහිටුවනු ලබන පළාත් කාර්යාලයක් සඳහාම කොමිෂන් සභාව විසින් පළාත් අධ්‍යක්ෂවරයෙකු පත් කළ යුතුය. එසේ පත් කරන ලද පළාත් අධ්‍යක්ෂවරයා, ඔහු/ඇය වෙත පවරා ඇති, අදාළ පළාත් කාර්යාලයට ලැබෙන පැමිණිලි පිළිබඳ විමර්ශන භාරව කටයුතු කළ යුතුය. පළාත් අධ්‍යක්ෂවරුන් කොමිෂන් සභාවේ මහජන පැමිණිලි විමර්ශන අංශයේ අධ්‍යක්ෂ වෙත සෘජුවම වාර්තා කළ යුතුය.

5. පොලිස් නිලධාරියෙකුට හෝ පොදුවේ පොලිස් සේවයට එරෙහිව ලැබෙන ඕනෑම මහජන පැමිණිල්ලක් ලද බව අදාල බලයලත් නිලධාරියා විසින් අප්‍රමාදව සහ එය ලැබුනු දින සිට වැඩ කරන දින 10 ක් ඇතුළත පැමිණිලිකරුට දැන්විය යුතුය.

6. මහජන පැමිණිලි විමර්ශනය කිරීම සඳහා, අවශ්‍යතාවයක් පැන නගින්නේ නම්, අමතර ස්වාධීන විමර්ශන නිලධාරීන් පත් කිරීමේ බලය සහ/හෝ අධිකාරිය කොමිෂන් සභාව සතුවේ. එලෙස පත් කරනු ලබන එවැනි ස්වාධීන විමර්ශන නිලධාරීන් කොමිෂන් සභාවේ මහජන පැමිණිලි විමර්ශන අංශයේ අධ්‍යක්ෂවරයාගේ මෙහෙයවීම යටතේ ඔවුන්ගේ රාජකාරි සහ කාර්ය කටයුතු ඉටුකිරීම අවශ්‍යවනු ඇත.

7. පොලිස් සිරමැදිරිවල රඳවා සිටින යම් පුද්ගලයකුගෙන් ප්‍රශ්න කිරීමට සහ එවැනි පුද්ගලයකු/පුද්ගලයින් පිළිබඳව විභාග කිරීමට මෙන්ම යම් තෙවන පුද්ගලයකු විසින් පැමිණිලි කරන ලද කරුණක් සම්බන්ධයෙන් සහ/හෝ ඊට අදාලව පොලිසියට කරන ලද ප්‍රකාශවල පිටපත් ලබා ගැනීම සහ අවශ්‍ය වෙනත් ලේඛන, වාර්තා ලබා ගැනීම ඇතුළුව යම් මහජන පැමිණිල්ලක් විමර්ශනය මෙහෙයවීමේදී යම් පොලිස් ස්ථානයක් වෙත යාමට "බලයලත් නිලධාරියෙකුට" හෝ කොමිෂන් සභාව විසින් පත්කරන ලද වෙනත් ස්වාධීන විමර්ශන නිලධාරියෙකු හට බලය පැවරීමට කොමිෂන් සභාවට හැකිය.

8. එවැනි පැමිණිලි විමර්ශනය කිරීම සඳහා අවශ්‍ය සියලුම ද්‍රව්‍ය/තොරතුරු/ලේඛන කඩිනමින් ලබාදීමෙන් මහජන පැමිණිලි විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවේ මහජන පැමිණිලි විමර්ශන අධ්‍යක්ෂවරයාට සහාය වීමට සහ පහසුකම් සැලසීමට පොලිස්පතිවරයා විසින් සියලුම පොලිස් නිලධාරීන්ට/ පොලිස් ස්ථාන වෙත නිශ්චිතව උපදෙස් නිකුත් කළයුතුය.

9. සියලුම පොලිස් නිලධාරීන්, ඔවුන්ගේ තරාතිරම නොසලකා, වාර්තා, ලේඛන ලබාදීමෙන්, ඉහත 2 වන රීතියෙන් අපේක්ෂිත මහජන පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සඳහා කොමිෂන් සභාව විසින් පත් කරන ලද බලයලත් නිලධාරීන්ට හෝ වෙනත් ස්වාධීන විමර්ශන නිලධාරීන්ට සහයවීමට බැඳී සිටිය යුතුය. එවැනි ඉල්ලීමක් ලැබුනු දින සිට සති දෙකක කාලයක් ඇතුළත යම් බලයලත් නිලධාරීන්/ ස්වාධීන විමර්ශන නිලධාරීන් විසින් ලිඛිතව ඉල්ලා සිටින තොරතුරු ලබාදීමට බැඳී සිටිය යුතුය. ඉහත නිශ්චිතව සඳහන් කර ඇති සති දෙකක කාලසීමාව තුළ එකී ඉල්ලා සිටින වාර්තාව ලේඛන හෝ තොරතුරු ලබාදිය නොහැකි නම්, අදාල ඉල්ලීමට අනුකූල වීමට ඇති නොහැකියාව පිළිබඳව ලිඛිතව හේතු දක්වමින්, තවත් සති දෙකක් නොඉක්මවන කාලයක් සඳහා කාලය ලබා ගැනීම සඳහා අදාළ පොලිස් නිලධාරියාට හිමිකම් ඇත්තේය.

10. එවැනි මහජන පැමිණිල්ලක් ලැබී මාස තුනක් ඇතුළත (03) මහජන පැමිණිලි විමර්ශනය සම්පූර්ණ කිරීමට සහ එවැනි යම් විමර්ශනයක තීරණය/ නිගමනය පැමිණිලිකරුට දැනුම් දීමට කොමිෂන් සභාව උපරිම උත්සාහය දැරිය යුතුය. යම් පැමිණිලිකරුවකු විසින් කරන ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් විමර්ශනය අවසානයේ එළඹුණු තීරණය/ නිගමනය පිළිබඳව දැනගැනීමට සෑම පැමිණිලිකරුවකුහටම අයිතියක් තිබිය යුතුය.

11. මහජන පැමිණිල්ලක් විමර්ශනය කිරීමේදී පොලිස් නිලධාරියෙකු විසින් විනය කඩකිරීමක්/ ආචාරධර්ම කඩකිරීමක් හෝ පොලිස් නිලධාරියෙකුට නුසුදුසු යැයි වර්ගීකරණය කර ඇති යම් හැසිරීමක් සංස්ථාපනය කරනු ලබන වරදක් හෝ ක්‍රියාවක් යම් පොලිස් නිලධාරියෙකු විසින් සිදුකර ඇති බවට අනාවරණය වුවහොත් ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන, පොලිස් ආඥාපනත යටතේ සාදන ලද දෙපාර්තුමේන්තු නියෝග සහ අදාළ රජයේ චක්‍රලේඛ ඇතුළුව එහෙත් ඊට සීමා නොවන, පවතින නීති/ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළයුතු වන්නේය.

12. මහජන පැමිණිල්ලක් සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනයක දී මතුවන සාපරාධී වරදක් සිදුකර ඇති බවට යම් සාක්ෂි පවතින අවස්ථාවක රටේ පවතින නීති/ රෙගුලාසි යටතේ අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සඳහා එවැනි කරුණු/ කාරණා සහ තත්වයන් පොලිස්පතිවරයාට යොමු කළයුතු වන්නේය.

13. මහජන පැමිණිලි විමර්ශනය කිරීමේදී අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් යම් කාරණයකට අදාළව මෙම රීති නිහඬ වන්නේ නම්, ඒ සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක සහ තීරණාත්මක විය යුත්තේය.

14. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් 2017 නොවැම්බර් මස 28 වන අඟහරුවාදා දිනැති අංක 2047/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2017 කාර්ය පටිපාටි රීති (මහජන පැමිණිලි) ඇතුළත් *ගැසට් නිවේදනය* මෙයින් අවලංගු කරනු ලැබේ.

EOG 08 - 0175

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.